# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අල් ජමියාතුල් ගෞශියා (සංස්ථාගත කිරීමේ)

**අල් ජමියාතුල් ගෞශියා සංස්ථාගත කිරීම සඳහා වූ
පනත් කෙටුම්පතකි**

---

වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ. කාදර් මස්තාන් මහතා විසින්
2016 අප්‍රේල් මස 07 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2016 පෙබරවාරි මස 29 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[101 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

2—PL 009888—225 (2016/04)

## අල් ජමියාතුල් ගෞෂියා (සංස්ථාගත කිරීමේ)

### අල් ජමියාතුල් ගෞෂියා සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"අල් ජමියාතුල් ගෞෂියා" යනුවෙන් සඳහන් කරනු ලබන සහ හඳුන්වනු ලබන ආයතනයක් ශුද්ධ වූ අස්සෙයිද් අශ්ෂෙයික් අබ්දූර් රෂිඩ් කෝයා තංගල් කද්දසාල්ලාහු ශිර්රාහුල් අසීස් තුමන් විසින් ඉස්ලාම් ධර්මය වෙනුවෙන් කරන ලද එතුමාගේ සුපිරිසිදු කැපවීම වෙනුවෙන්,අස්සෙයිද් අශ්ෂෙයික් අබ්දූර් රෂිඩ් කෝයා තංගල් කද්දසාල්ලාහු ශිර්රාහුල් අසීස් තුමා විසින් එකඟ වූ රීති අනුව එකී ආයතනයට සම්බන්ධ සියලු කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ :

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද, ඒ පරමාර්ථ හා කරුණු එකී ආයතනය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කොට ඉටු කොට සහ ඇති හෙයින් ද, එම ආයතනය සංස්ථාගත කරනු ලැබීම පිණිස ඉල්ලීමක් කර ඇති හෙයින් සහ එකී ඉල්ලීම මහජන යහපත පිණිස වන හෙයින්ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2016 අංක  දරන අල් ජමියාතුල් ගෞෂියා (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අල් ජමියාතුල් ගෞෂියා සංස්ථාගත කිරීම.

**2.** මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) "අල් ජමියාතුල් ගෞෂියා" හි නිර්මාතෘ අස්සෙයිද් අශ්ෂෙයික් අබ්දූර් රෂිඩ් කෝයා තංගල් කද්දසාල්ලාහු ශිර්රාහුල් අසීස් තුමා සහ එතුමාගේ පෙළපතේ සාමාජිකයන් (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "අල් ජමියාතුල් ගෞෂියා" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ සහ පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරිය එම සංස්ථාවට ඇත්තේ ය.

2— PL 009706 -300 (2016/01)

සංස්ථාවේ පරමාර්ථ.

**3.** සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශුද්ධ වූ කුරාණය, හදීස්, පීකුහු සහ හිපුලු ආගමික දේශනා වර්ධනය කිරීම සඳහා පංති පැවැත්වීම;

(ආ) අරාබි ව්‍යාකරණය ඉගැන්වීම සහ ෂාපි, හන්ජි සහ මදුහබ් නීතිය අධ්‍යයනය කිරීම සංවිධානය කිරීම;

(ඇ) ඉහත කී දේශනා සහ කුරාණය කට පාඩම් කීමට අදාළ පර්යේෂණ පැවැත්වීම සහ වර්ධනය කිරීම ;

(ඈ) මුහම්මද් නබි තුමාණන් අනුස්මරණය කිරීම සහ අනෙකුත් අධ්‍යාත්මික නායකයන් අනුස්මරණය කිරීම ;

(ඉ) කිදිරියා තරීක්කා ස්ථාපකරු වන ශුද්ධ වූ අස්සෙයිද් අශ්ෂෙයික් අබ්දුල් කාදිර් ජිලානි මැතිතුමාගේ ගුණානුස්මරණ දේශනා පැවැත්වීම, සහ සිහිකිරීම ;

(ඊ) මෞලවී පාඨමාලා සාර්ථකව සම්පූර්ණ කරන ලද සිසුන්ට සහතික පත් ප්‍රදානය සඳහා උපාධි ප්‍රදානෝත්සව සංවිධානය කිරීම ;

(උ) සතිපතා රාතිබ් මජ්ලිසය පැවැත්වීම සහ වාර්ෂික දානය පැවැත්වීම ;

(ඌ) උර්දු සහ අනෙකුත් භාෂා අධ්‍යයනය කිරීම, ප්‍රවර්ධනය කිරීම ;

(එ) ඉස්ලාමීය විද්‍යා පොත්වලින් සමන්විත පුස්තකාලයක් පවත්වාගෙන යාම සහ මද්රසා සිසුන් අතර කියවීමේ ආශාව ප්‍රවර්ධනය කිරීම ;

(ඒ) ඉහත කී පුස්තකාලය සහ මද්රසා ආයතන මගින් අහුලස් සුන්නත් වල්ජමාත් වලට අදාල මූලික මූලධර්මයන්ට අදාළ අධ්‍යයන ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම ;

(ඔ) ඉස්ලාම් ආගම තරිකාස් සහ මද්රාසා ප්‍රවර්ධනය සඳහා පර්යේෂණ පැවැත්වීම සඳහා පුස්තකාලය පොත්පත් වලින් සමන්විත කිරීම ;

(ඕ) සංස්ථාවේ ඉහත සඳහන් සියලුම පරමාර්ථ හෝ ඉන් කිසිවක් මුදුන් පමුණුවා ගැනීම සඳහා ආනුෂංගික වන්නාවූ හෝ අනෙකුත් සියලුම දේ හා ක්‍රියාවන් ශුද්ධ වූ අස්සෙයිද් අශ්ෂෙයික් අබ්දුර් රෂීඩ් කෝයා තංගල් කද්දසල්ලාහු ශිර්රාහුල් අසීස් තුමාගේ අභිමතය පරිදි ඉටු කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4.** බැංකු ගිණුම් ආරම්භ කිරීම, පවත්වාගෙන යාම, වැසීම, මුරිදීන්ස්, මුහිබීන්ස් හෝ අනුගාමිකයන්ගේ සහ පරිත්‍යාගශීලින්ගෙන් ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම, ප්‍රදාන සහ පරිත්‍යාග භාර ගැනීම හා එකතු කිරීම, ස්වකීය අරමුදල් සංස්ථාව විසින් ගන්නා ලද හෝ පවරා ගන්නා ලද ඉඩම්වල ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් ආයෝජනය කිරීම, සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් බඳවා ගැනීම, සේවයේ නියුක්ත කිරීම සහ සේවයෙන් පහ කිරීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා, කාරණා සහ දේවල් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සිදු කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5.** (1) සංස්ථාවේ අධ්‍යාත්මික නායකයන්, ඔවුන් අධ්‍යාත්ම නායකයන් ලෙස ක්‍රියාත්මක වන තාක්කල් යාවජීව අනුග්‍රාහකයා වන්නේ ය.

(2) සංගමයේ අධ්‍යාත්මික නායකයන් මෙම නීතිය ආරම්භ කරන ලද දින සිට සහ ඉන් පසුව නම් වශයෙන්—

(අ) ශුද්ධ වූ අස්සෙයිද් හසන් කෝයා තංගල් ;

(ආ) ශුද්ධ වූ අසසෙයිද් හුසෙයින් කෝයා තංගල් ;

(ඇ) ඔවුන්ගේ නීත්‍යානුකූල පැවතෙන්නන් සහ උරුමකරුවන් ඔවුන් විසින් නම් කරනු ලබන්නෝය.

සංස්ථාවේ රීති.

**6.** (1) සංස්ථාවේ කටයුතු මෙම පනතේ නියමයන් සහ පාලක මණ්ඩලයෙන් සමන්විත සංස්ථා මගින් කාලානුරූපීව බලපවත්වනු ලබන රීතිවලට අනුකූලවිය යුතු යැයි එබඳු රීතිවලින් සපයනු ලැබිය හැකි සහ රීති අනුව පත් කරනු ලබන වෙනත් නිළධාරීන්ගෙන් සමන්විත පාලක මණ්ඩලයක් මගින් පාලනය කළ යුතු වන්නේ ය.

(2) නීතිය ආරම්භ කරන ලද දින සිට පාලනයේ සිටින සංස්ථාවේ විධායක කමිටුව සංස්ථාවේ පළමු පාලක මණ්ඩලය වන්නේ ය.

(3) යාවජීව අනුග්‍රාහකයන්ගේ අභිමතය පරිදි වෙනත් ලිඛිත නීතියක නියෝගය සමග නොගැලපෙන නොවන ලෙසට නීති සකස් කිරීමට කාලයෙන් කාලයට නිර්දේශ කිරීම පාලක මණ්ඩලයට නීත්‍යානුකූල වේ.

(4) යාවජීව අනුග්‍රාහකයන්ගේ අභිමතය පරිදි සකස් කරනු ලබන රීති වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කළ හැක.

(5) ආයතනය සතු ඉඩම් හා ගොඩනැගිලි මෙම ආයතනයේ ස්ථාපකරු වන දිවංගත ශුද්ධ වූ අස්සෙයිද් අශ්ෂෙයික් කෝයා තංගල්, අල් -කාදිරිය වර් රිපායා (කද්දසල්ලාහු ශිර්රාහුල් අසීස්) තුමාගේ හා එතුමාගේ අනුප්‍රාප්තිකයෝ සහ උරුමක්කරු වන්නේ ය.

**සංස්ථාවේ අරමුදල.**

**7.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පැවරුම්, පරිත්‍යාග වශයෙන් ලැබෙන සියලුම මුදල් කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ වැඩි ගණනක සංස්ථාවේ නමින් තැන්පත් කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා සංස්ථාව විසින් දරනු ලැබූ සියලු වියදම් අරමුදලින් ගෙවනු ලැබිය යුතුය.

**සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.**

**8.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පැවරෙන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ශුද්ධෝත්තම අස්සෙයිද් අශ්ෂෙයික් අබ්දුර් රෂීඩ් කෝයා තංගල් කද්දසල්ලාහු ශිර්රාහුල් අසීස් තුමාට ඇත්තේ ය.

**සංස්ථාවේ මුද්‍රාව.**

**9.** සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් යටතේ, ඔවුන් මගින් ඔවුන්ගෙන් හා ඔවුන් යටතේ හිමිකම් පාන්නන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම් වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**11.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.